# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2248/35 - 2021 ඔක්තෝබර් මස 06 වැනි බදාදා - 2021.10.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 ඔක්තෝබර් මස 04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ඔක්තෝබර් මස 04 වන දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

(1) එම නිවේදනයෙහි අංක ''6.1 මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන '', 01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඉවත් කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි අංක "6.0 මුදල් අමාත්‍ය" ශීර්ෂය යටතේ වන ''03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" පහත පරිදි;

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. සැමට ප්‍රතිලාභ විහිදෙන, සියළු පළාත් ආවරණය වන, ආදායම් විෂමතා අවම වන, තිරසර ඉහළ ආර්ථික වර්ධන වේගයක් ඇති කර ගැනීම
2. අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩුකර ගැනීම හා ඒක පුද්ගල ආදායම ඉහල නංවා ගැනීම
3. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුල මිල ස්ථාවරත්වය ඇති කිරීම



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩු කර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාවයන් අවම කිරීම
5. ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුලින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම
6. රුපියලේ අගය ස්ථාවරත්වය තහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම
7. දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම
8. පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම
9. රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම
10. රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම
11. ඉතුරුම් හා ආයෝජන දිරි ගැන්වෙන පරිදි බැංකු, මූල්‍ය ආයතන ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
12. බිඳවැටී ඇති මූල්‍ය ආයතන ව්‍යාපාර නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
13. කෘෂිකර්මය, ඉදිකිරීම් ක්ෂේත්‍රය,තොරතුරු තාක්ෂණ කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංචාරක සහ අපනයන අංශ දියුණු කිරීම සඳහා ජාතික සංවර්ධන,මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ වැඩසටහන් සම්බන්ධීකරණය හා පුළුල් කිරීම
14. බැඳුම්කර හා කොටස් වෙළඳපළ ආකර්ශණිය කරවීම
15. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ප්‍රාථමික වෙළඳපළ ප්‍රතිසංස්කරණ හා නියාමන කටයුතු ශක්තිමත් කිරීම
16. අන්තර් ජාතික ව්‍යාපාර ප්‍රමුඛයන් (International Business Giants) ගේ ව්‍යාපාරික ආයතන වල ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය ආශ්‍රිතව ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම
17. විදේශ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පෞද්ගලික අංශයේද සහය ඇතිව සෞභාග්‍යයේ දැක්ම නව ආර්ථික සැලැස්ම ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණ වැඩපිළිවෙල දියත් කිරීම
18. මහා පරිමාණ දේශීය ආයෝජකයින්ට අධිතාක්ෂණික නිෂ්පාදන (High Technology Products) ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම
19. දේශීය ව්‍යාපාරිකයන්ට තරඟකාරීව නිසි ලෙස ව්‍යාපාර ක්ෂේත්‍රවලට විදේශ ආයෝජන ප්‍රවේශ නියාමනය හා දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඔවුන්ව සවිබල ගැන්වීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
20. රාජ්‍ය ව්‍යාපාර ආර්ථික හා සමාජීය වශයෙන් ජාතික ආර්ථිකයේ කරනු ලබන දායකත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් ඒවායේ මූල්‍ය ශක්තිය වැඩිකිරීම.

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. **භාණ්ඩාගාර කටයුතු**<br><br>i. මහා භාණ්ඩාගාරය<br>ii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>iii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>iv. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>v. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>vi. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව<br>vii. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>viii. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව<br>ix. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>x. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>xi. නීති කටයුතු දෙපාර්තමේන්තුව<br>xii. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව<br>xiii. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br>xiv. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>xv. ජාතික මෙහෙයුම් මැදිරිය | • විසර්ජන පනත්<br>• රේගු ආඥාපනත(1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත (2010 අංක 17)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)<br>• සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)<br>• මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)<br>• මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)<br>• දේශීය ආදායම් පනත (2017 අංක 24)<br>• රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)<br>• ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)<br>• දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)<br>• ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)<br>• ව්‍යාපාර නාම පනත (1987 අංක 7)<br>• සමාගම් පනත (2007 අංක 7)<br>• වෙළඳ සළකුණු පනත (1964 අංක 30) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| **2. රාජ්‍ය ආදායම් කළමනාකරණ කටයුතු**<br><br>i. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>ii. ශ්‍රී ලංකා රේගුව<br>iii. සුරාබදු දෙපාර්තමේන්තුව<br>iv. ජාතික ලොතරැයි මණ්ඩලය<br>v. සංවර්ධන ලොතරැයි මණ්ඩලය<br>vi. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br><br>**3. බැංකු මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපල ප්‍රතිපත්ති හා නියාමන කටයුතු**<br><br>i. ශ්‍රී ලංකා මහ බැංකුව<br>ii. සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන<br>iii. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>vi. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>v. ණය තොරතුරු කාර්යංශය<br>vi. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>vii. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>viii. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br>ix. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව<br>x. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව<br><br>**4. අරමුදල් කළමනාකරණය**<br><br>i. ලෝහෝර් ආර්යා අරමුදල<br>ii. වර්ජන, කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල<br>iii. ජාතික රක්ෂණ භාර අරමුදල<br>iv. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල<br>v. ශ්‍රම වාසනා අරමුදල<br>vi. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල<br>vii. වකුගඩු අරමුදල<br>viii. තේ ශක්ති අරමුදල<br>ix. කප්රුක අරමුදල<br>x. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල<br>xi. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>xii. දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>xiii. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල<br>xiv. තුරුසවිය අරමුදල | • සීට්ටු ආඥාපනත (1935 අංක 61)<br>• පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)<br>• මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)<br>• ආනයන හා අපනයන (පාලන) පනත (1969 අංක 1)<br>• මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)<br>• මුද්දර ගාස්තු පනත (1982 අංක 43)<br>• එකතු කළ අගයමත බදු පනත (2002 අංක 14)<br>• මුදල් පනත (1971 අංක 38)<br>• පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)<br>• බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)<br>• සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)<br>• ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)<br>• මුදල් නීති පනත (1949 අංක 58)<br>• ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30)<br>• මහජන බැංකු පනත (1961 අංක 29)<br>• ලංකා බැංකු ආඥා පනත (1938 අංක 53)<br>• බැංකු පනත (1988 අංක 30)<br>• බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත 1990 අංක 4<br>• ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)<br>• ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)<br>• නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත<br>• ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (1937 අංක 07)<br>• ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත (2005 අංක 28)<br>• මුදල් ව්‍යාපාර පනත (2011 අංක 42)<br>• විදේශ විනිමය පනත (2017 අංක 12)<br>• රක්ෂණ සංස්ථා පනත (1961 අංක 02)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත (1990 අංක 18)<br>• දාෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9) |

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 5. **ඈවර කිරීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට නියමිත ආයතන**<br><br>i. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව<br>ii. වනජීවී භාරය<br>iii. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය<br>iv. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව<br>v. මාශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය<br>vi. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්<br>vii. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල<br>viii. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතන | • ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13)<br>• ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)<br>• නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7)<br>• ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත (2019 අංක 12) |

(3) එම නිවේදනයෙහි අංක ''6.2 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය ''6.1 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ලෙස නැවත අංකගත කිරීමෙන් ;

10 - 253

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.